කුරුවිට තරුණියක් ඝාතනය කොට සැකකරු දිවි තොර කරගැනීමේ සිදුවීමට මෙම සතිය වන විට ලැබෙන මාධ්‍ය ප්‍රචාරය අඩුවක් නැත. එසේම ඇතැම් මාධ්‍ය මගින් එම ඝාතනයට ලක්වූ තරුණියගේ ඡායාරූපය දිගින් දිගටම පළ කරමින් ඊට ප්‍රසිද්ධියක් ලබාදීමේත් ක්‍රියාවේත් අවසානයක් දක්නට නැත.

මෙසේ නැවත නැවතත් ඇගේ ඡායාරූපය ප්‍රකට කිරීම ඔස්සේ මියගිය තරුණියට අගෞරවයක් සිදුවන බවත්, ඇගේ පවුලේ අයට සිත්වේදනාවක් ඇති විය හැකි බවත් මෙම ඇතැම් මාධ්‍ය මගින් සැලකිල්ලට ගන්නා බවක් ද පෙනෙන්නට නැත.

මෙසේ නැවත නැවතත් ඇගේ ඡායාරූපය භාවිතා කිරීම එසේ සිදුවීම භාවාතිශය ඉදිරිපත් කිරීමක් විය හැකි බවත්, එය මාධ්‍ය ආචාර ධර්මයන්ට අනුකූල නොවන බවත් එම ඇතැම් මාධ්‍ය වටහා ගන්නා බව ද පෙනෙන්නට නැත.
#MediaEthicsSL #lkr #Divaina #Mawbima #Aruna